# නිර්මාණ Nirmana

## හෙළ දරුවන්ට !

ඉගෙනුම පිණිස හෝ රැකියාවක් පිණිස
අමතම් පැමිණ සිටිනා හෙළ දරු පිරිස
සිහිකර ඔබෙ පැතුම් ගැන උදයද සවස
ඉටුකර ගන්න යහපති දැරුවොත් වෙහෙස

සම්පත් ඇතත් මෙහි දක්නට හැම තැනම
නැත වුවමනා බොහො දේ රැස්කර ගැනුම
පෙන්වයි සරල දිවියෙහි ගුණ බුදු දහම
රැකවරණයක් වෙයි එය සිහියට ගැනුම

වසරේ වැඩි කලක් තුළ සීතලෙන් තද
විඳිමින් ගැහැට අවදිව මෙහි අඳුර මැද
පිටවී ගොසින් වැඩවල නිරතව නිබඳ
ඔබ මෙහි සිටින්නේ නිසි සැපතක් නොවිඳ

පොඩි දිවයිනකි අප රට ලොව තුළ පිහිටී
පවතී බුදු දහම එහි නොමැකිව කිලිටී
උවදුරු ඇති වුවත් පෙර රුපුනගෙ කපටී
පවතින සිරිත් තවමත් රන් රුවක් වටී

ඔබ මෙහි රැඳී සිටියත් දියුණුවක් පතා
ඩැහැගන්නට එපා මෙහි ඇති විලා සිතා
පෙරදිග ගති සිරිත් හැමදා අගෙයි ඉතා
කටයුතු කළ මැනවි ඒ රැකගන්න සිතා

දරුවන් මෙහෙදි ලැබු හෙළ මව්පිය වරුනී
ඔබ ගෙවු ළමාවිය සිරිලක තුළ රමණී
සිහිකර දරුවන්ගෙ යහගුණ දම් කළණී
වඩනට වෙහෙසෙන්න එය යුතුකම බැවිනී

*විශාමලත් විදුහල්පතිනි*
♦ ***ප්‍රේමා අදිකාරි***
**Morden Surrey UK**

## ප්‍රාර්ථනා !

ගිලිහුණා දෙන් පැතුම් කුසුමන්
හද උයන් තෙර හුදකලා කොට
සැඟවුණා දෙන් අහස සඳ තරු
මුවා කොට මා අන්ධකාරෙට
නිමවුණා දෙන් සොඳුරු සිහිනය
දෙනෙත් යුග කඳුළකින් බොඳ කොට
නොරැඳුණා දෙන් මගේ සෝගිනි
ඔබේ හද තුළ මෙයින් මතු වට

කඳුළු තිමිරය ඔබේ මුදු අතැඟිලි
තුඩින් ගෙන සැනසුණා දෙන්
අඳුරු විජිතය උපුල් දෙනුවන්
කැළුම් දහරින් එළිවුණා දෙන්
අහිමි පුදසුන තැවුණු හද මල
සෙනෙහසින් ඔබෙ පිබිදුණා දෙන්
සසර කෙළවර නිවන් දක්නා
තුරාවට අපි හමුවුණා දෙන්

♦ ***සන්ධ්‍යානි සේනාරත්න***
Surbiton, Surrey **UK**

## ජීවිතය

පියකරුව සිනා නගමින්
දැහිලි විහිදුවා හඬමින්
සුරතල් වදන් දොඩමින්
බිළිඳු කල ගෙවයි සතුටින්

දුව පැන නටා හැපෙමින්
උගෙන වැඩිවියට පා තබමින්
යහපත අයහපත දකිමින්
ඒ මේ අත දෝලනය වෙමින්

ආවේනික වූ දෙයක්ම කරමින්
සමාජයට හිත අහිත
දේ දකිමින්
වැඩිහිටියෙකු වෙමින්
පීඩිතව මනස අවුලින්

තවකෙකුගෙ සරණ පතමින්
ඔහු ඇය ආලයෙන් බැඳෙමින්
පීඩනය දෙගුණ කර ගනිමින්
හිනැහෙයි ලොවට
දසන් නගමින්

නැවත නැවත ඉපිද මැරෙමින්
ගෙවන මේ බිහිසුණු රඟහලෙන්
ඉවත්විය හැකි මගම දහමෙන්
ලබාගන්නෝ සියයට දශමයෙන්

♦ ***සීතා කුමාරි***
Limassol **Cyprus**

**මෙම නිර්මාණ පිටුවේ පළකිරීම සඳහා ඔබේ කාව්‍ය රචනා එවන්න. අපේ ලිපිනය වෙනස් වූ බව කරුණාවෙන් සලකන්න. 2 පිටුවේ නව ලිපිනය ඇත.**

## කාලය

කාල තුරඟු
යන පිම්මේ
නැත මඳකට
නවතින්නේ
යොවුන්
වියෙන්
මහලු වියට
මා
කැඳවාගෙන
යන්නේ

**DAREN**
**London**
**NW3**



## අපට රජෙක් ඇත !

මේ රට හැර වෙන අපට රටක් නැ
ඒ රට අපටය බෙදන වැටක් නැ
වාරෙට අයිතිය කියන කටක් නැ
පාරට වැටුණොත් පෙනෙන හෙටක් නැ

සහ යෝගෙන් සිට අවගුණ දුරලා
පහ කොට ඇති බිය සැක දුර හැරලා
යහ එව සිටියා මිස දොර හැරලා
මහ ජාතිය නැත කරදර කරලා

කොන් ද නමාගෙන කැලවල් අස්සේ
හැංගි හැංගි බියකින් හැම තිස්සේ
සිංහ වංසෙ අය රණ බිම ඔස්සේ
හැංගි හැංගි නැත සටනට බැස්සේ

වෙන් කොට කොටසක් උරුම බිමක් සේ
ගන්නට යනවිට දැමුව ඇමක් සේ
පෙන් නුව මුව දැක මිතුරු දමක් සේ
දන් නෙමු හිතු හැටි නිවට කමක් සේ

පැවත ආපු ලෙස සුහදව රැදෙමු
හැමත ම විමසිලි ජාලෙක බැඳෙමු
ඉවත නොගොස් ඉදිරියටම ඇදෙමු
නැවත ඔළුව උස්සන්නට නොදෙමු

මංගල උළෙලට සළු ඇඳ පේවී
පෙම් බැඳ දකුණෙන් දුම්රිය දේවී
සම් පත් අරගෙන උතුරට යාවී
ලංගම බස් දැක ඇය හිනැ හේවී

අතට අවිය ගෙන කොටසක් ඉල්ලූ
රටට විපත් කළ මහ කොටි පෙල්ලූ
සතුට හිතට දී ජය කොඩි ඇල්ලූ
අපට රජෙක් ඇත මුළු ලොව හෙල්ලූ

♦ ***කිවිපති පාතකඩ කුලතිලක***
**මහරගම Sri Lanka**

## බෝධිපූජා

සුවඳැති මලින් මල් මාලා ගොතා ගෙන
සුවඳැති පැන් කෙණ්ඩි දෝතින් දරා ගෙන
සුවඳැති සඳුන් දල්වන්නට සිතා ගෙන
සුවඳැති සිතින් නමදිමු පින් පතා ගෙන

රන් කොත උඩින් පුන් සිසි එයි සිනා සෙන
රන් බෝපත් සැලෙයි වීණා වයා ගෙන
සුදු බෝ මළුවෙ සදහම් හඬ රැව් නගන
දහසක් පහන් සිළු දැල්වෙයි සිත පිනන

වෙසෙසින් විඩාබර ගත සිත සනස වන
මේ සා විපත් කරදර මැද නතර වෙන
දැඩි සිත් ලතෙත් කරවා ඔසු පැන් ඉසින
සම්බුදු හිමිගෙ ගුණකඳ මිස කොහෙද වෙන

♦ ***වසන්තා කුමාරි දසනායක***
**කිරිඳිවැල Sri Lanka**

## පැනය



ඉරගල වැටෙනා සැන්දෑවේ
මා හැර ගිය ඒ හෝරාවේ
මතකය තාමත් මා සිත රිදවයි
තනිවන විට හැම නිමේශයේ

නුඹමද ඒ මම පෙර දිනයක දුටු
නුඹමද ඒ මම සංසාරේ පැතු
අසන එකම එක පැනයකි මා සිත
විඳවන රිදවන හඬවන හැම දින

නුඹමද ඒ මගෙ දුක සැප විමසූ
නුඹමද ඒ මගෙ හදවත සැනසූ
අසන එකම එක පැනයකි මා සිත
විඳවන රිදවන හඬවන හැම දින

♦ ***ශ්‍රියානි එදිරිසිංහ***
**Sri Lanka**

## නොලියූ කව

**පහන් තරුව දිලුණා**
**කවක් පබැඳින්න හැදුවා**
**සසල හද බිතු පුරා**
**ඒ කව**
**ඇඳී මියැදී ගියා**

**හදේ රාවය**
**සෙමින් ඉකිබිඳ**
**හඬනු මට ඇසුණා**
**කඳුළු රස දැනුණා**
**අඳුරු මේකුළු**
**සෙමින් ඇවිදින්**
**පහන් තරුව වැසුවා**
**සහන් එළිය නිවුණා**
**මියැදි ඒ කව උඩින්**
**මිනී මලක් පිපුණා**

♦ ***එරංගා පෙරේරා***
**Netherlands**

## ලක් මවගෙන් විවරණ

සිටියා මට පුතෙකු පෙර දුටු ගැමුණු කියා
ඔබයි පුතේ යළි ඉපදුණු මිහිඳු කියා
ඔබ දෙදෙනාම සතුරන් ජයගත්ත නියා
ඉතිහාසයේ රන් අකුරින් ලියවි ගියා

ඇකයේ හොවා මා ඔබ දැඩි කෙරුවා ට
මා ණයගැතියි මගෙ දුක් ගිනි නිව්වා ට
දෙදණ නවා නුඹ මා සිප වඳින කොට
උණු කඳුළක් නැගුණි මාගේ නෙත් කොණට

ගැරහුම් වලට නොසැලී නුඹ සිටිය පුතේ
අවුරුදු තිහක් මා විඳි දුක් නිමයි පුතේ
මගේ හිතට සැනසුම ළං කෙරුව පුතේ
මතු බුදුවෙන්න විවරණ මගෙ මිහිඳු පුතේ

♦ ***කුමාරි විජේරත්න***
Hounslow Middx **UK**

## විරු දරු පරපුරට

යමා මහ පෙළහරක් පාමින්
රුදුරු මරු සෙන් හලු කළේ
මං මුළා වූ යුගය නිම කොට
සිතට නිවනක් සැදුවේ

ගැමුණු ගජබා කුමරු වූයේ
ඔබය මගෙ විරු දරුවනේ
රන් වැටක් වී සිටිනු මැන
මේ බිම රකින්නට මතු දිනේ

♦ ***අමර ගුණසේකර***
*Paris* ***France***

## ආයාචනා !

වැදූ මව් වගෙම යයි සිතලා උපන් බිම
සමගිව සිටිමු අමතක කර භේද හැම
අපි ලක් දරුවො මෙහි වෙසෙනා සියළු තම
පෙන්වමු ලෝකයට මව්බිමෙ ඉහළ කම

සංකර සිරිත් පසු පස අපි නොයමු හැම
සුරකිමු අපේ යුතුකම් හා සිහළ කම
සිරිත් විරිත් ගරුකොට දෙමු මුල් තැනම
ලෝකයෙ කොතැන වුව එය වෙයි හැඳුණු කම

ආවේ කතර අපි කහවණු සොයන් නට
එබැවින් මිතුර සිදුවෙයි දුක් විඳින් නට
නිවලා පවුලෙ බඩ සා ගිනි ඉඳන් රට
වීරිය කරමු යහපත් ලෙස වෙසෙන් නට

♦ ***විමලා යාපා (ඇඹිලිපිටිය)***
Nicosia **Cyprus**

## මියගිය දිනක

මියගිය දිනක මළකඳ කදිමට අන්දා
අගනා දෙණක රජ යහනක මෙන් රන්දා
ඉදිකර තොරන් සුදු කොඩි මග දිග බන්දා
දිය කරනුයෙ මුදල් කිම මළගම හන්දා

ඉගිලෙන සරුංගල් බැඳි නූලෙන් කැඩුණ
පාවෙන පරිදි නිම් හිම් නැති උඩු ගුවන
යන්නට නොදී මළ අය බැඳගෙන කරන
වැලපුම් අඳෝනා කුමටද පල නොදෙන

මිහිදන් කිරීමයි මළ පසු කළ යුත්තේ
චිතකෙක දවාලූවද වරදක් නැත්තේ
මළකඳ ගෙයි තබා දැනගෙන මේ තත්තේ
වැළපී දින ගණන් මොන පලයද ඇත්තේ

ණය වී හතර අතටම නම්බුව පිණිස
රස මසවුළෙන් සතපා නෑදෑ පිරිස
දින ගණනක්ම වින්දත් දිව රෑ වෙහෙස
මළගිය අයට අත්වෙද සුර සැප කෙලෙස

ගෙන්නා දුරින් නෑ මිතුරන් මළ ගමට
නැතිකර මිළ මුදල් කාලය හා සතුට
කරදර කරන එක ඔවුනට දී ගැහැට
ගවුරවයක් නොවේ පරලොව ගිය අයට

කුණුවෙන මිනිය කල් යන්නට පෙර දිනම
මිහිදන් නැතොත් ගිනිබත් කර හැකි වහම
කළ යුතු දෙය වන්නෙ නුවණැතියන් නියම
සමරණ එකයි මළවුන්ගේ ගුණ මහිම

♦ ***ටී. එස්. අබේවික්‍රම***
Harrow Middx **UK**

**මාත් එන්නද යන මෙම පැදි පෙළ ලියූ ජයන්ත මෙන්ඩිස් කවියා ලේක්හවුස් ආයතනයේ බොහෝ කාලයක් සේවය කර දැනට වසර කීපයකට පෙර මිය ගියේය. ඔහු මෙය රචනා කළේ ඔහුගේ බිරිඳගේ මරණයෙන් ටික දිනකට පසුවය. ඔවුන් දෙදෙන අතරේ වූ බැඳීම කොපමණදැයි මේ කවිවලින් අපට වැටහේ. එහෙත් ඔහුගේ සිතේ වූ සන්තාපය කොපමණ දැයි අපට හිතාගන්නට බැරි ය.** →

## පලද්දීම

පින් බිම යුද බිමක් කළ තිස් වසක් පුරා
පෙන් විය මැර බලය මොහු ආයුදත් දරා
සුන් කළ මිනිස් ජීවිත රට කොහෙත් සරා
ඉන්නේ සදහටම නිහඬව පණත් හැරා

අරන්තලාවේ බුදුපුත්වරුන් හට
සිදුකළ විපත වැන්නක් නෑ අසන් නට
සැරසී සිටිය දුටු දුටුවන් නසන් නට
තිරිසන් මරුවන්ට සිදුවිය නැසෙන් නට

අපෙ ඇත්තෝ කොතෙක් මියැදී ඇද්ද අනේ
කොටි ගැත්තෝ දිවිත් නහගෙන නැද්ද වනේ
නුවණැත්තෝ පැවසූ පරිදීම සිද්ද වුනේ
අවිගත්තෝ නැසෙති අවියෙන් ඇත්ත වුණේ

ජීවිත සේම ගොඩනැගිලිත් අළු වීය
ඊළම් උන්මාදයෙන් මොහු පසු වීය
කළ අපරාද මුළු ලොවටම හෙළි වීය
සිරිලක් රුකෙහි පිළිලය දැන් සුව වීය

දළදා ආනුභාවය නොම දන්න හෙයින්
මොහු වෙර දැරී තෙත් කරනට එබිම ලෙයින්
වැරදුණී ඉලක්කය කල්ලිය නොසිතූ සෙයින්
ලැබුණේ විපාකය වලටම යන්න මෙයින්

කොටියන් විනා මුන් මිනිසුන් වෙයිද කෙසේ
කොපමණ සිටීවිද ගිනිදැල් ඇවිල හිසේ
පුදබිම් සේම ජීවිත නැසූ දැහැමි දෙසේ
පලදුන්නේය පිට පිට කොටි රැළට මෙසේ

ලස් සන මුතු ඇටේ දිස්නය සිඳුණේ ය
තිස් වසරක්ම යුදගිනි රැස් වැදුණේ ය
පස් යට නිදන්නට දඬුවම් යෙදුණේ ය
නස් පැත්තිය ඔවුන්ටම අද හැරුණේ ය

♦ ***රවිකා චන්ද්‍රා රාජපක්ෂ***
**යක්කල Sri Lanka**



## හැර ගිය සිතට !

සිත නුඹ යන්න ගිහින්
පවුරු ඉවුරු මැද මා මෙහි රඳවා
කඳුළු සයුරු සත් සමුදුරු කළඹා
සිත නුඹ යන්න ගිහින්

සීමා නැති ආදරයක් වටකොට
සීමා මායිම් ඇන්දේ කවුරුද
උතුරා ගිය මිනිසත්කම ගුළි කොට
තලා පෙළා විසි කෙරුවේ කවුරුද

දිනෙක මගෙම වුණු නුඹ මට ඇතයි
සඳට සෙවන දෙන අහස තරම්
අසල රැඳී මා දවන තවන දුක
ගැඹුරුයි මහ සාගරය තරම්

♦ ***ශ්‍රියා කුමාරසිංහ***
**New Zealand**

## මාත් එන්නද?

දවසක් දහවලේ
සිටින විට හුදකලා වූ නිවස ඉදිරිපිට
අසළ නිවසක වහලෙන්
නැගුණා දුමක් සුවඳක්ද දැනුණා බැදුමෙක
කන්තෝරු යන්ට පෙර ඔබත් මමත්
කඩිමුඩියේ ඔබ සැදූ -
විහිළුවෙන් තහළුවෙන්
යහළුවන් සමග බෙදා හදා කෑ
කන්තෝරු බත්පතේ සුවඳ
දැනුණා නැහැයට සැනින්
හෝස්ගා පත්තුවී නැගුණා දුමක් පපුවෙන්
සේදුනා කඳුලින්
පාළු කුටියේ හුදකලාව
වැතිරී සිටින විට යදිමින්
සීතල රැයේ අඳුරට මුර ගාමින්
දුම්රියක් ඇදෙන හඬ ඇසේ
මගේ පපුව මතින්
ඔබත් මමත් නිබඳවම
එහෙ මෙහෙ ගියේ දුම්රියෙන්
ඒත් අද ඔබ තනිව ගමනක් ගොසින්
අදින්නට බැරිද දම්වැල
එල්ලෙන්නට ඇවිත් දුවගෙන
බහින්නට ඔබ බහින තැනින්ම

♦ ***ජයන්ත මෙන්ඩිස්***